එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් වොල්කර් ටුක් මහතා ශ්‍රී ලංකාවේ සිය නිල සංචාරය අවසානයේ සිදුකළ ප්‍රකාශය

කොළඹ, 2025 ජූනි 26

සුභ සන්ධ්‍යාවක් සහ මෙම අවස්ථාවට පැමිණීම පිළිබඳව මාගේ ස්තූතිය පුදකර සිටිමි.

දින තුනක් පුරාවට ක්‍රියාත්මක වූ මාගේ නිල සංචාරයේ නිමාව අද දින මෙසේ සනිටුහන් කරන අතර, සැබෑ වෙනසක හැඟීම මා හට දැනේ. එම කාලසීමාව තුළදී දේශපාලන සහ ආගමික නායකයන්, සිවිල් සමාජ නියෝජිතයන්, මෙන්ම මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට ගොදුරු වූ පුද්ගලයින් ඇතුළු විවිධ පාර්ශවයන් සමඟ මානව හිමිකම් සම්බන්ධ ගැටළු රැසක් සාකච්ඡා කිරීමට මට හැකි විය. පොහොසත් ජන සංස්කෘතියක් සහ විවිධත්වයෙන් පිරි මෙම සුන්දර දිවයින ඉදිරියේ පවතින අභියෝග සහ අවස්ථා පිළිබඳව මෙම සාකච්ඡා තුළින් මා හට ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට හැකිවිය.

සියල්ලටත් වඩා, මෙම සංචාරයේදී රජය දැක්වූ සහයෝගය වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

මීට පැයකට පමණ පෙර මා හට ජනාධිපතිතුමා මුණගැසීමට හැකි විය, තවද සංචාරය ආරම්භයේදී අග්‍රාමාත්‍යතුමිය මෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ අනෙකුත් මැති ඇමතිවරුන් සහ දේශපාලන පක්ෂ නායකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ ද සාකච්ඡා පැවැත්වීමට හැකිවිය. දුෂ්කර ගැටළු විසඳීම සඳහා අව්‍යාජ විවෘතභාවයක් අපගේ එම සාකච්ඡා මඟින් පැහැදිලිව පිළිබිඹු විය.කොළඹදී, අගවිනිසුරුවරිය, නීතිපතිවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ ආරක්ෂක ප්‍රධානීන් හමුවීමටත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, හානිපූරණය සඳහා වන කාර්යාලය සහ ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය ඇතුළු ස්ථාන වෙත ගොස් සාකච්ඡා කිරීමටත් අවස්ථාව හිමිවිය.

සමස්ත සංචාරය පුරාවටම, සිවිල් සමාජය සංවිධානවල නියෝජිතයන් සමඟ අර්ථවත් සාකච්ඡා පැවැත්වීමටත්, මානව හිමිකම් උල්ලංඝනයන්ට ගොදුරු වූවන් සහ වින්දිතයින් විසින් ප්‍රකාශ කරන්නට යෙදුණු හද කම්පා කරන ප්‍රකාශයන් හට සවන් දීමේ අවස්ථාව ද හිමිවිය.

මෑතකදී නැවත විවෘත කරන ලද වෙම්මනි සමූහ සුසාන භූමිය වෙත මා ඊයේ දිනයේ දී සිදුකළ සංචාරය, ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙකුගේ ජීවිතවල අතීතයේ අඳුරු මතකයන් තවමත් නොනැසී පවතින බව මතක් කර දෙන්නට විය. ඒ සඳහා ප්‍රවේශය ලබාදීම පිළිබඳව ද මා බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. එහිදී, තවමත් තම ආදරණීයයෙකු සොයමින් ශෝකයෙන් තැවෙන පවුලක් මුණගැසුණු අතර, අවුරුදු ගණනාවකට පසුව වුව ද ඔහුගේ දේහය හෝ යළි ගොඩගනු ඇතැයි යන විශ්වාසය මත ඔවුහු

බලාපොරොත්තු දල්වාගෙන සිටිති. අනෙකුත් දහසකුත් එකක් ජනතාව මෙන්ම, ඔවුන් ද වසර 30ක පමණ කාලයක් දිගැදුණු අවිනිශ්චිතතාවයට අවසානයක් සනිටුහන් කිරීමේ උත්සාහයක නිරත වී සිටිති.

වින්දිත කණ්ඩායම් තම අතුරුදහන් වූ ආදරණීයයන් වෙනුවෙන් සත්‍යය සහ යුක්තිය වෙනුවෙන් පෙනී සිටීම අඛණ්ඩව සිදුකරගෙන යති. යාපනය සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයන්හි සිදුකළ සංචාරයේදී බොහෝ මව්වරුන් සිදුකළ ප්‍රකාශ මෙන්ම, දකුණු පළාතේ බලහත්කාරයෙන් අතුරුදහන් කළ පුද්ගලයින් පිළිබඳ තොරතුරු ද මා හට අසන්නට ලැබුණි. උදාහරණයක් වශයෙන් දකුණු පළාතේ එක් කාන්තාවක්, 1989 දී අතුරුදහන් වූ තම සැමියා සොයමින් තවමත් නගරයෙන් නගරයට ගමන් කරමින් සිටින බව ඇය මා හට පැවසුවාය. තම ආදරණීයයන් සොයමින් සිටින සිංහල, දෙමළ සහ මුස්ලිම් සියල්ලන්ගේ ම කඳුළු එකිනෙකාගෙන් වෙනස් නොවේ.

පෙර දින යාපනයේදී මා නිරීක්ෂණය කළ පරිදි, වින්දිතයින් අනුස්මරණය කිරීම සඳහා වඩා පුළුල් අවකාශයක් වර්ධනය වෙමින් පැවතීම දක්නට ලැබීම පිළිබඳව මම සතුටට පත්වෙමි. කෙසේ වෙතත්, මෙම වෙනස නොතකා, මානව හිමිකම් ආරක්ෂකයින් ඉලක්ක කරගනිමින් එල්ලවන පැරණි අසාධාරණ ක්‍රියා පිළිවෙත් තවමත් පවතින බව දැනගන්නට ලැබිණි. විශේෂයෙන් සම්පත් සීමිත තත්ත්වයන් යටතේ, ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලියේදී සිවිල් සමාජ සංවිධාන විශ්වාසවන්ත හවුල්කරුවන් සහ මිත්‍රවරුන් ලෙස ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරමින් කටයුතු කරති.

අතීතයේ නොවිසඳුණු ගැටළු නව රජයට ප්‍රබල අභියෝගයක් ඉදිරිපත් කර ඇත. පසුගිය මාස කිහිපය තුළ ජනාධිපතිවරයා විසින් සිදුකළ ප්‍රකාශ මා සළකා බලන ලද අතර ඒවා මා තුළ බලාපොරොත්තුවක් සහ ධනාත්මක හැඟීමක් ඇති කිරීමට සමත් විය. එහිදී ඔහු සියලු ප්‍රජාවන්ට අයත් ජනතාව අත්විඳි පොදු වේදනාව සහ ශෝකය ප්‍රසිද්ධියේ පිළිගෙන ඇත. මෙම වෙනස ගොඩනැගීම වැදගත් වන අතර, එය අර්ථවත් ප්‍රතිඵලයකට පරිවර්තනය කිරීම අත්‍යවශ්‍යය. එමඟින්, තම ආදරණීයයන්ට සිදු වූ දේ පිළිබඳ සත්‍යය අනාවරණය කර ගැනීමට හැකියාව ලැබේ.යුක්තිය, හානිපූරණය සහ නැවත ඇති නොවීම සහතික කිරීම කල් පවතින සාමයක් සඳහා අත්‍යවශ්‍ය වනවා සේම, අතීතය පිළිගැනීම සහ සත්‍යය පැවසීම සුවපත් කිරීම සහ නිමාව සාක්ෂාත් කර ගැනීම සඳහා වන ප්‍රධාන පියවර වේ.

වින්දිතයින්ගේ විශ්වාසය හිමි විශ්වාසදායක දේශීය වගවීමේ ක්‍රමයක් පිහිටුවා ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දැඩි අභියෝගවලට මුහුණ දී තිබේ. මේ හේතුව නිසා, ශ්‍රී ලාංකිකයන් ජාත්‍යන්තර සහයෝගය සහ යාන්ත්‍රණයන් වෙත යොමු වෙමින්, තම දේශසීමාවලින් ඔබ්බට යුක්තිය පැතීමට පියවර ගනිමින් සිටී. අවසාන වශයෙන්, වගකීම අදාළ රාජ්‍යයට ම අයත් වන අතර, මෙම ක්‍රියාවලිය ජාතික වශයෙන් මෙහෙයවීම සහ හිමිකාරිත්වය දැරීම ඉතාම වැදගත් වේ. තවද ජාත්‍යන්තර ක්‍රම මගින් එයට අවශ්‍ය ඌනපූරණයන් සැපයීම සහ සහාය ලබා දී ඉදිරියට ගෙන යාම කළ හැකි වේ. තොරතුරු රැස් කිරීම සහ සංරක්ෂණය කිරීම සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ අපයෝජනයන් විශ්ලේෂණය කිරීම සඳහා මාගේ කාර්යාලයට නියම වී ඇති අතර ඒ සඳහා කැපවූ ව්‍යාපෘතියක් ස්ථාපිත

කර ඇත. මෙය ශ්‍රී ලංකාව තුළ සහ ජාත්‍යන්තර වශයෙන් අනාගත වගවීමේ ප්‍රයත්නයන්ට සහාය විය හැකි වේ යැයි මම බලාපොරොත්තු වෙමි.

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය ඇතුළු වැදගත් සිදුවීම් කිහිපයක් සම්බන්ධයෙන් රජය විසින් පරීක්ෂණ සහ නඩු පැවරීම නැවත ආරම්භ කර ඇති අතර ඒවා ඉදිරියට ගෙන යාමේ ප්‍රයත්නයන් මම තවරදුටත් දිරිමත් කරමි. අවම වශයෙන් ඇතැම් දිගුකාලීන හා නියෝජිත මානව හිමිකම් නඩුකරවල ප්‍රතිඵල ලබා ගැනීම ප්‍රබල ප්‍රදර්ශනාත්මක හා මහජන විශ්වාසය ගොඩනැගීම සඳහා ඉමහත් බලපෑමක් ඇති කරනු ඇත.

වධහිංසාවලට ලක්වූවන්ගේ ජාත්‍යන්තර දිනය ද අද ට යෙදී තිබේ. වධහිංසා සහ ලිංගික හිංසනය ගැටුම් සමයේ දී කැපී පෙනෙන ලෙස නිරූපණය වූ අතර ඒවා වර්තමානයේදීත් වාර්තා වේ. ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වධහිංසාවට පැමිණවීම අපරාධයක් වුවද, වධහිංසාවට පැමිණවීම පිළිබඳ පැමිණිලි රට පුරා දිගින් දිගටම ලැබෙමින් පවතී. එබැවින්, මෙම පද්ධතිමය ගැටළුව අවසන් කිරීම සඳහා බොහෝ වැඩකටයුතු සිදු කළ යුතු බැවින් ආරක්ෂක අංශය සහ පොලිස් ප්‍රතිසංස්කරණ සිදුකිරීම ඉතාමත් තීරණාත්මක අවශ්‍යතාවකි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදුකරන දිගුකාලීන ප්‍රශංසනීය සේවය පිළිබඳ මාගේ කෘතඥතාව පළකර සිටින අතර ඔවුන් හා අප අතර ශක්තිමත් හවුල්කාරිත්වයක් පවත්වාගෙන යමින් සිටිමු. විශේෂයෙන්, අත්අඩංගුවේ සිටියදී සිදුවන මරණ සම්බන්ධයෙන් පොලිසිය සමඟ සම්බන්ධ වී වැදගත් කාර්යයක් ආරම්භ කර ඇත අතර එය ඉතා අගය කොට සලකමි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අවලංගු කරන ලෙසත්, එය භාවිතා කිරීම අත්හිටුවන ලෙසත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දිගුකාලීනව රඳවා සිටින රැඳවියන් සහ සිරකරුවන් සම්බන්ධයෙන් කඩිනම් සමාලෝචනයක් සිදුකර ඔවුන් නිදහස් කරන ලෙසත් ඉල්ලා සිටිමි. එසේම මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත ද අවලංගු කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අයිතිවාසිකම් සම්බන්ධයෙන් මෑත වසරවල යම් ප්‍රගතියක් ඇති වුවද, ඒ සමඟම අඛණ්ඩ අභියෝගද දක්නට ලැබී ඇත. 2024 නොවැම්බර් මැතිවරණයේදී කාන්තාවන් 22 දෙනෙකු පාර්ලිමේන්තුවට තේරී පත් වූ අතර, කාන්තා සහභාගීත්වය දෙගුනවී සියයට 9.8ක් පැවතුණු අතර, එය අතීතයට වඩා වැඩිය. නමුත් එය තවදුරටත් වැඩිවිය යුතුය. රැකියා ස්ථානවල දී, කාන්තාවන් සමාන රැකියාවන් සඳහා පිරිමින්ට වඩා සියයට 27ක් අඩුවෙන් උපයන අතර බොහෝ කාන්තාවන්, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ ව්‍යාප්තිය ඉහළ නැංවී ඇත. මගේ අවබෝධය අනුව පසුගිය පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද සමලිංගික සබඳතා අපරාධයක් නොවන බව දැක්වෙන පනත් කෙටුම්පත නීතිගත කිරීමට ගන්නා උත්සාහයන් මම සාදරයෙන් පිළිගනිමි.

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත ද ජාත්‍යාන්තර මානව හිමිකම් නීතියට අනුකූල වන පරිදි සංශෝධනය කළ යුතුය.

2022 දී, ශ්‍රී ලාංකිකයන් - විශේෂයෙන් වඩාත්ම අවදානමට ලක්විය හැකි පිරිස - මතකයේ පවතින අන්දමට වඩාත් දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දුන්හ. වතුකරයේ වැඩකරන ජනතාව මුහුණ දෙන දැඩි දුෂ්කරතා පිළිබඳ විස්තර අසන්නට ලැබීමෙන් මා දැඩි කනස්සල්ලට පත් වූ අතර, ඉඩම්, නිවාස සහ සාධාරණ වැටුප් සඳහා ප්‍රවේශය වැනි ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම අත්‍යවශ්‍ය වේ.

2022 අරගලය විරෝධතාවලින් උද්ගත වූ ජනප්‍රිය ඉල්ලීමක් වූයේ, දූෂණය සහ ආර්ථික අවකළමනාකරණය සඳහා වගවීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙසයි.

මේ සම්බන්ධයෙන් රජය සිදු කරමින් යන කාර්යභාරය පිළිබඳව මා සතුටට පත්වන අතර, මෙම බලාපොරොත්තුව සහ වෙනස පිළිබඳ ප්‍රවණතාව අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මෙය නව සමාජ ගිවිසුමක් සඳහා පදනම විය හැකිය. මෙතුළින් මානව හිමිකම් ආර්ථිකයකට සංක්‍රමණය වීමට පවා අවස්ථාවක් තිබේ - ආර්ථික විද්‍යාවෙන් ඔබ්බට නිරීක්ෂණය කරමින් සහ සමාජ ගැටලුවලට හේතුවන ප්‍රධාන සාධක කෙරෙහි අවධානය යොමු කරමින් සහ අතීතයේ සිට පැවත එන අසමානතාවය, අයුක්තිය සහ තිරසර නොවන භාවිතාවන් වැනි ගැටළු ආමන්ත්‍රණය කළ හැක.

රජයේ හමුදාව විසින් තවමත් අත්පත් කරගෙන ඇති සහ ආර්ථික වශයෙන් භාවිතා කරන්නට යෙදුණු ඉඩම් නිදහස් කිරීමේ වැදගත්කම සහ පුරාවිද්‍යා, ආගමික හා සංරක්ෂණ ගැටළු සම්බන්ධ ඉඩම් ආරවුල් අදාළ ප්‍රජාවන් සමඟ සාකච්ඡා කර විසඳීමේ වැදගත්කම මම අවධාරණය කරන්නෙමි. මුස්ලිම් ජනතාව ද කැමති නම් නැවත තම ඉඩම්වලට යාමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතුය.

ආගමික නායකයින් සමඟ පැවති සාකච්ඡාවලදී මානව හිමිකම් සහ අන්තර් ආගමික අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන් සතුව ඇති තීරණාත්මක කාර්යභාරය මම අවධාරණය කළෙමි. මෙය සාමකාමී, සුහදශීලී හා සදාචාරාත්මක සමාජයක් සඳහා ප්‍රධාන සාධකයකි. වෛරී ප්‍රකාශ සහ ආගමික හේතු මත සිදුවන උසිගැන්වීම් වඩ වඩාත් සාමාන්‍ය දෙයක් බවට පත්වෙමින් පවතින ලෝකයක, මෙය මුලිනුපුටා දැමීම සඳහා ඔවුන්ගේ බලපෑම භාවිතා කරන ලෙසත්, මම ඔවුන්ගෙන් ඉල්ලා සිටියෙමි.

නව රජය "ජාතික සමගිය" පිළිබඳ මූලික ඉලක්කයක් තබා ඇත. විශ්වාසය සහ සංහිඳියාව වර්ධනය කිරීම සඳහා ඉක්මන් ජයග්‍රහණ සහ විශ්වාසය ගොඩනැගීමේ ක්‍රියාමාර්ග ගැනීම ප්‍රධාන වේ. මේ සඳහා සහාය වීමට සහ සහාය ලබා දීමට මගේ කාර්යාලය නිතැතින්ම සුදානමින් සිටී.

ජනවාර්ගිකත්වය, ආගම, භාෂාව, සංස්කෘතිය, කුලය සහ පන්තිය වැනි අනන්‍යතා දේශපාලනය මගින් යටපත් නොකර, ඒවා පිළිගනිමින් සමාජය ගොඩනැගීමට රජය සහ සිවිල් සමාජය යන දෙපාර්ශවයටම පැහැදිලි වුවමනාවක් ඇතැයි යන දැඩි විශ්වාසය සහිත ව මම පිටත්වෙමි.

යුද්ධය, ආර්ථික අවිනිශ්චිතතාවය සහ මානව හිමිකම් උල්ලංඝනයන් කණගාටුදායක ලෙස සාමාන්‍යකරණය වූ ලෝකයක ශ්‍රී ලංකාව ආදර්ශමත් කතාවක් බවට පත්වීම දැකීම මාගේ පැතුම වන අතර, තවද ඉදිරියේ දී රජය සමඟ සාධනීය මැදිහත්වීමක් සිදු කිරීමට ද බලාපොරොත්තු වෙමි. ඇත්ත වශයෙන්ම, සාමකාමී සහජීවනය, අනෙකා තේරුම් ගැනීම, ඉවසීම, වෙනස්කම් පිළිගනිමින් ඒවා විවිධත්වයක් ලෙස විඳිමින් සහ එය ජාතික ශක්තියක් ලෙස සලකමින් ලොවටම ආදර්ශයක් සැපයීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුව පවතී.

සමාප්තිය.